# GLOBAL ACADEMIC RESEARCH INSTITUTE

COLOMBO, SRI LANKA

## GARI International Journal of Multidisciplinary Research

ISSN 2659-2193

**Volume: 07 | Issue: 01**

On 28th February 2021

http://www.research.lk



Author: R.M. Ushan Perera

University of Kelaniya, Sri Lanka



GARI Publisher | Liberal Feminism | Volume: 07 | Issue: 01

Article ID: IN/GARI/ICSSH/2020/128A | Pages: 171-177 (07)

ISSN 2659-2193 | Edit: GARI Editorial Team

Received: 29.11.2020 | Publish: 28.02.2021

# ජාතක කතා සහිත්‍යය පදනම් කරගත් නාට්‍ය සාහිත්‍යය තුළ නිදහස් කාන්තා නියෝජනය පිළිබඳව අධ්‍යයනයක්

(A Study on the Representation of Liberal Women in Theater Literature Based on Jathaka Tales)

*R.M.Ushan Perera*
University of Kelaniya
Ushan.pushpakumara@gmail.com

## Abstract

ගෞතම බුදුන්වහන්සේ දීපංකර බුදුන්ගෙන් විවරණ ලබාගත් තැන් පටන් වෙස්සන්තර ආත්මභාවය දක්වා ජීවන ස්වභාවය ගෙනහැර පාන්නා වූ කතා එකතුවක් ලෙස ජාතකකතා සාහිත්‍යය හැඳින්වීමට පුළුවන. දීර්ඝ කාලයක් සංස්කරණය වෙමින් නිර්මාණය වී තිබෙන ජාතකකතා සහිත්‍යයේ කතෘ අඥාත ය. මෙහි ඇතැම් කතා බුද්ධ භාෂිත අතර ඇතැම් කතා උපමාකතා ලෙස ජාතකකතා සාහිත්‍යයට එකතු වී තිබේ. පුරුෂ මූලික සමාජය තුළ සංස්කරණය වූ මෙම ජාතකකතා සාහිත්‍යය තුළ කාන්තාව ලාමක, අණුවන, අසත්පුරුෂ, චපල දුශ්චරිතයත් දුක්ඛයට වස්තුදායකය යන ආස්තානයකට ලඝුකොට තිබේ. කාන්තාව පිළිබඳව වඩාත් ප්‍රජාතාන්ත්‍රික ලිබරල් ආස්තානයකින් කියවනවාට වඩා, පුරුෂමූලික සන්දර්භය තුළ කාන්තාවගේ පීඩනයෙන් නිදහස්වීම සඳහා තම නිවස තුළත් ඉන් පිටතත් තමන්ට රුචි දේ තම මනාපය අනුව තෝරා ගැනීමේ නිදහස හා තම ජීවිත පාලනය කිරීමේ ස්වකීය අයිතිය බොහෝ ජාතකකතා තුළ උල්ලංගණය කොට ඇත.

මෙරට ජාතක කතා පාදක කරගනිමින් නිර්මාණය වූ නාට්‍ය නිර්මාණයන් තුළ ස්ත්‍රී භූමිකාව ජාතක කතාකරුවාගේ දෘෂ්ඨිවාදයෙන් මුදවා වඩාත් සංකීර්ණ වූ ද සානුකම්පිත වූ ද නිදහස් අරගලයක පිහිටුවීමට නිර්මාණකරුවා උත්සහගෙන තිබේ. උදාහරණ වශයෙන් "මනමේ" නාට්‍යය තුළ ජාතක කතාකරුවාගේ පාරම්පරික දෘෂ්ඨිය වූ **"මාතුගාමයෝ නම් පව්ටු සත්ව කෙනෙක"** යන්න බිඳ හෙළයි. මනමේ කුමරියගේ සිත තුළ ඇතිවන අනිසි බිය නිසා ජීවිතයේ ප්‍රථමවතාවට ස්වයං තීරණයක් ගැනීමට නාට්‍යකරුවා එම චරිතය මෙහෙයවයි. සිතීමේ නිදහස, අරගලය හා ජීව විද්‍යාත්මකව ඇතිවන සිතිවිලි ප්‍රවාහය තුළ එම චරිතයේ කාරකගුණය ඉස්මතු කරවයි. මනමේ කුමරා මරුමුවට පත්වන්නේ කුමරිය තුළ ඇතිවන එම අරගලය වැදිරජු විසින් අවස්ථාවක් බවට පත්කරගන්නා නිසා ය.

නිදහස් ප්‍රේමය, නිදහස් ලිංගිකත්වය, නිදහස් චින්තනය, නිදහස් පරිභෝජනය හා අධ්‍යාපනික නිදහස වැනි ප්‍රජාතාන්තික නිදහසක් කාන්තාව කෙරෙහි නිර්මාණය කරමින් නාට්‍ය තුළ කාන්තාව හසුරුවා තිබේ. නිගමනයක් වශයෙන් ජාතක කතා සාහිත්‍ය තුළ කාන්තාවට අහිමි වූ නිදහස ඇති කිරීමට නාට්‍යකරුවා නාට්‍ය සාහිත්‍ය තුළ උත්සහගෙන තිබෙන බව නිගමනය කිරීමට පුළුවන.

ප්‍රමුඛ පද - නාට්‍ය දෘෂ්ඨිය, ලිබරල් ස්ත්‍රීවාදය *(Liberal feminism)*,ස්ත්‍රී කාරකගුණය *(Feminist Action Quality)*, තීරණ ගැනීමේ නිදහස *(Freedom of decision-making)*

**සාකච්ඡාව -**

ජාතක කතා ආශ්‍රයෙන් නිර්මාණය වූ වේදිකා නාට්‍ය නිර්මාණ රැසක් පවතී. කෝලම්, නූර්ති, නාඩගම් වැනි නාට්‍ය සම්ප්‍රදායන් තුළ ජාතක කතාකරුවා විසින් ගෙන ආ දෘෂ්ඨිවාදය එලෙසින් ම වෙනස් නොකොට අන්තර්ගතව තිබිණි. නමුත් 1950 න් පසුව නිර්මාණය වූ ජාතක කතා ආශ්‍රිත වේදිකා නාට්‍ය තුළින් නිර්මාණකරුවා ස්වකීය දෘෂ්ඨිවාදයක් ගෙන එනු ලබයි. ප්‍රධාන වශයෙන් ජාතක කතාකරුවා විසින් සමාජගත කරනු ලබන කාන්තාව පිළිබඳව සාම්ප්‍රදායික දෘෂ්ඨිය නාට්‍ය නිර්මාණකරුවා විසින් බිඳ හෙළයි. ඒ වෙනුවට කාන්තා චරිතයන්ගේ ක්‍රියාකාරීත්වය නිදහස් පැවැත්මෙහි අරගලයක් ලෙස නිර්මාණකරුවා ගෙන එයි. ජාතක කතා ආශ්‍රයෙන් නිර්මාණය වී තිබෙන නාට්‍යය නිර්මාණයන්ගේ කාන්තා කාරකගුණය*(Feminist Action Quality)* වඩාත් නිදහස් ස්ත්‍රීවාදී ප්‍රවේශයක් ගන්නා බව පෙන්වාදීම මෙම පර්යේෂණයේ දී සිදු කෙරේ.

නිර්මාණකරුවන් විසින් ලෝකය නැමති නිර්මාණාත්මක මූළ බීජ ගබඩාව තුළින් හඳුනාගනු ලබන වඩාත් ප්‍රයෝග්‍ය මෙන් ම නාටකේය ගුණ පෙන්නුම් කරන සංකල්පයන් නිර්මාණාත්මක ප්‍රවේශයකින් වේදිකාවට ගෙන එනු ලබන්නේ මුල් සංකල්පය මත සිට ගනිමින් ස්වකීය දෘෂ්ඨිවාදාත්මක සංකල්පයක් ද ඒ තුළ ප්‍රතිනිර්මාණය කරමින් ය. මෙම ක්‍රියාවලියේ දී ඓතිහාසික පුරාණෝක්ති හෝ කතා මූළයන් පාදක කර ගනිමින් නාට්‍ය නිර්මාණයන් සිදු කිරීම ඓතිහාසික කාරණාවකි. ග්‍රීසියේ සිටි ඊස්කිලස්, සොෆොක්ලීස්, (ඉ)යුරුපිඩීස්ගේ සිට බර්ටෝල්ඩ්බ්‍රෙෂ්ට්, විලියම් ශේක්ස්පියර් වැනි නිර්මාණකරුවන් දක්වා ද මෙම ක්‍රියාවලිය සිදු විය. මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය කලාව තුළ සංවර්ධනය වෙමින් ආ මිස්ටරි, මිරකල් සහ මොරැලිටි වැනි නාට්‍යමය ප්‍රභේදයන් තුළ ද ක්‍රිස්තියානි ශුද්ධ වූ බයිබලයෙහි අන්තර්ගතව පැවති දෙවියන් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් පිළිබඳව හා යුද වීරුවන් සහ ආගමික දේවගැතිවරුන් පිළිබඳව කතා නාට්‍යමය ආකෘතියෙන් ප්‍රතිනිර්මාණය වන්නට විය. ඉන් මොරැලිටි ප්‍රභේදය වඩාත් ආගමික දාර්ශනික මුහුණුවරකින් ගොඩනැගිණි. එහි දී ඇතැම් විට ඉතිහාසය නැවත කියවීමට සමාජය හුරුවිය.

ග්‍රීසියේ හෝමර්ගේ විසින් රචිත ඉලියඩ් සහ ඔඩෙසි වැනි ඓතිහාසික කතා ග්‍රීක නාට්‍යකරුවා විසින් වේදිකාවට ගෙන ආ අතර, ඒ හා සමානවම ජාතක කතා තුළින් ද නිර්මාණය වූ වේදිකා නාට්‍ය නිර්මාණයන් බොහොමයක් පවතී. කෝලම්, නූර්ති වැනි නාට්‍යමය ප්‍රවේශයන්හි දී මෙම ප්‍රවේශය වඩා හොඳින් දැකගන්නට පුළුවන. නමුත් ප්‍රධාන ලෙස ම කෝලම් හා නූර්ති දෙවර්ගයෙහි දී ම ජාතක කතාකරුවාගේ දෘෂ්ඨිය වෙනස් කිරීමක් නොවුණි. ජාතක කාතාවෙන් නිරූපිත දෘෂ්ඨිවාදාත්මක ප්‍රවේශය ශ්‍රව්‍ය, දෘෂ්‍ය මෙන් ම සූච්‍ය කොටසින් ද එලෙසින් ම නිරූපණය කරන ලදී.

අතීත පුරාණෝක්ති පදනම් වී කෙරෙන වේදිකා නාට්‍ය නිර්මාණ රැසක් අපට පෙරදිග මෙන්ම අපරදිග ද දැක ගන්නට පුළුවන. ඊඩිපස් රජ , ඇන්ටිගනී වැනි නාට්‍ය උදාහරණ ලෙස ගත හැකිය. නමුත් එම නිර්මාණ තුළ පුරාණෝක්තිය අභිබවා යමින් දාර්ශනික ප්‍රවේශයන් අන්තර්ගත කරමින් නිර්මාණකරුවා දෘෂ්ඨිවාදාත්මක ප්‍රවේශයකට පැමිණ තිබේ. විශේෂයෙන් ම ඇන්ටිගනී වැනි නාට්‍ය තුළ ඇන්ටිගනී වැනි ස්ත්‍රී චරිත වඩාත් නිදහස් අරගලයක් කෙරෙහි ක්‍රියාත්මක කරවයි.රාජාධිකාරකය හමුවේ

ස්වයං තීරණ ගැනීමේ අයිතිය සහ ඒ හමුවේ ඇතිවන තත්වයන් දරා සිටීම මෙන් ම  ඉන් නිදහස් වීම ඇන්ටිගනී නාට්‍ය තුළ පිළිබිඹු වේ.

18 වන සියවස වන විට නූර්ති නාට්‍යකලාව ශ්‍රී ලාංකේය නිර්මාණකරුවා අතර වඩාත් ප්‍රචලිත ව වර්ධනය වන්නට පටන් ගැනිණි. නූර්ති නාට්‍ය, එවකට පැවති නිදහස් අරගලය සමඟ සංවර්ධනය වූයේ ඓතිහාසික කතා, චරිත කතා මෙන් ම ජාතක කතා පාදක කර ගනිමින් නිදහස් අරගලයට උර දීමක් වශයෙන් යැයි කීමට පුළුවන.

18 වන සියවස අග භාගයේ සිට ලෝකයේ නිර්මාණවේෂයන්ගේ සූචාර්ථයන් වෙනස්වන්නට පටන් ගැනිණි. පුද්ගලයාගේ පැවැත්ම මෙන් ම ඒ තුළ විටින් විට ඇතිවන ශූන්‍යත්වයන් ද, පුද්ගල අයිතීන් පිළිබඳව දාර්ශනිකව කියවන්නට මෙම වකවානුව පෙළඹිණි. දාර්ශනික ස්ථාවරයන්ගේ බලපෑම මෙන් ම පුද්ගල පැවැත්මේ නිදහස පිළිබඳව මූලික අදහස්, නිර්මාණ තුළින් සමාජගත වන්නට විය. එය කලාව වශයෙන් පමණක් නොව සෙසු විෂය ක්ෂේත්‍රයන් තුළ ද දැක ගන්නට හැකි විය. චිත්‍රකලාව, සංගීතය, නර්තනය වැනි නිදසුන් වශයෙන් ගත හැකි විෂයක්ෂේත්‍රයන් තුළ මෙය ඉතාමත් පැහැදිලිව දැකීමට හැකිය.

බටහිර ස්ත්‍රීවාදී සංකල්පයන් වඩාත් අරගලකාරී ප්‍රවේෂයකින් වර්ධනය වන්නට පටන් ගන්නේ 19 වන සියවසේ මුල් භාගයේ සිටම ය. එහි සෙවනැලි ආසියාතිකර නිර්මාණ තුළින් ද පෙනෙන්නට පටන් ගැණිනි. කාන්තාවාදය තුළ ප්‍රධාන ලෙස අර්ථ දක්වන්නා වූ සංකල්පය වන්නේ පීඩනයෙන් නිදහස් වීම, සඳහා තම නිවෙස් තුළත් ඉන් පිටතත් තමන්ට රුචි දේ තම මනාපය අනුව තෝරා ගැනීමේ නිදහස සහ තම ජීවිත පාලනය කිරීමේ අයිතිය තිබිය යුතුය යන්නයි. ස්ත්‍රීවාදී ඇගයීම් තුළින් ඔවුන් අපේක්ෂා කරන ලද නිදහස් ප්‍රේමය, නිදහස් ලිංගිකත්වය, නිදහස් චින්තනය, නිදහස් පරිභෝජනය, අධ්‍යාපනික නිදහස වැනි මූලික සංකලයන් නාට්‍ය නිර්මාණ හරහා සමාජගත වන්නට විය.

1950 හි දී පමණ සිට මෙරට නිෂ්පාදනය වූ නාට්‍ය නිර්මාණයන් තුළ ද මෙය දැකගත හැකිවිය. විශේෂයෙන් ම ජාතක කතා පාදක කරගනිමින් නිර්මාණය වූ නාට්‍ය නිර්මාණයන් තුළ ස්ත්‍රී භූමිකාව ජාතක කතා කරුවාගේ දෘෂ්ටිවාදයෙන් මුදවා වඩාත් සංකීර්ණ වූ ද සානුකම්පිත වූ ද නිදහස් අරගලයක පිහිටුවීමට නිර්මාණකරුවා උත්සහගෙන තිබේ. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ පබාවතී , මනමේ නාට්‍යයේ සිට පුණ්‍යසේන ගුණසිංහයන්ගේ දික්තල කාලගෝල, තුසිත ලක්නාත්ගේ චක්‍රපානි නාට්‍ය දක්වා මෙම ලිබරල් ස්ත්‍රීවාදී අරගලය දැකගත හැකිය.

**නාට්‍ය නිෂ්පාදනයන් බවට පත් වූ ජාතක කතා**

- මනමේ - චුල්ලධනුග්ගහ ජාතකය
- කදාවළලූ - සේරිවාණිජ ජාතකය
- රත්තරන් - පදමානවක ජාතකය

- වෙස්සන්තර - වෙස්සන්තර ජාතකය
- භව කඩතුරාව - ලෝමහංස ජාතකය
- චත්‍රපානි - ධර්මද්වජ ජාතකය
- සඳකිඳුරු - චන්ද කින්නර ජාතකය
- පිංගුත්තර - උම්මග්ග ජාතකය
- දික්තල කාලගෝල - උම්මග්ග ජාතකය
- ඒකට මට හිනා හිනා - උම්මග්ග ජාතකය
- ස්වර්ණ හංස - ස්වර්ණ හංස ජාතකය
- ගුත්තිල - ගුත්තිල ජාතකය
- උදුම්බරා - උම්මග්ග ජාතකය
- උමංදාව - උම්මග්ග ජාතකය
- මානසවිල - බක ජාතකය
- සොඳුර වර්ණදාසි - කණවේර ජාතකය

ජාතක කතාව තුළින් සමාජගත කිරීමට උත්සහ දැරූ මතවාදයට වඩා නාට්‍යකරුවා ස්වකීය සමාජ දේශපාලනික හා සංස්කෘතිමය ස්ථාවරයක් ගොඩනගා ගැනීමට උත්සහගත් බවක් පෙනෙන්නට පවතී. එම නාට්‍ය තුළ අන්තර්ගත චරිතයන්ගේ ක්‍රියාකාරීත්වය ද ජාතක කතාවට වඩා වෙනස් ප්‍රවේශයකින් අර්ථකතනය වීම සිදු වී තිබෙන බව ද පෙනෙන්නට පවතී. එහි දී එම නාට්‍ය තුළ නිරූපණය වන්නා වූ කාන්තා චරිතයන් ස්ත්‍රී පුරුෂ ජීව විද්‍යාත්මක සමාජකෝණයෙන් මුක්තව වඩාත් ලිබරල්වාදී කාරකගුණයන්ගෙන් හසුරවා තිබෙන බව දැකිය හැකිය. ජාතක කතා තුළ කාන්තා චරිතයන්ගේ ක්‍රියාකාරීත්වය සාම්ප්‍රදායික පුරුෂ දෘෂ්ඨිය සහ බමුණු දෘෂ්ඨියෙන් විග්‍රහ කරයි.කාන්තාව යනු සමාජ කුඩුම්බය තුළ අනුවණ, කපටි, පාපයට උණපූරණ කාරකයක් ලෙස පුරුෂමූලික ස්ථාවරත්වයකින් යුතුව ජාතක කතාකරුවා සමාජගත කරවයි. නමුත් ජාතක කතා පදනම් කරගනිමින් නාට්‍ය නිර්මාණකරණයට යොමු වන නිර්මාණකරුවා **කාන්තා නිදහස, නිදහස් චින්තනය, සමාජ සාධාරණත්වය (Social Justice), ප්‍රතිචාරාත්මක ඇගයීම (Responsive Evaluation)** වැනි ස්ත්‍රීවාදී ඇගයීම් සඳහා වඩාත් ගුණාත්මක වටිනාකමක් දීමට උත්සහ ගෙන තිබේ. සරච්චන්ද්‍රයන්ගේ පබාවතී නාට්‍යයේ සිට ලෝමහංස නාට්‍යය දක්වා වූ ප්‍රධාන ස්ත්‍රී චරිත විමසුමට ලක් කිරීමේ දී කාන්තාව පිළිබඳව සාම්ප්‍රදායිකව තිබූ දෘෂ්ඨිය නිර්මාණකරුවා නිවැරදි කරනු ලබයි. **කාන්තා විමුක්තිය** යන සංකල්පය මඟින් කලාව හා සමාජය පිළිබඳව නව දැක්මක් ඇති කළ හැකි බව සරච්චන්ද්‍රයන් පෙන්වා දෙයි. සාහිත්‍ය තුළ ඇති පුරුෂාධිපත්‍යයන් නිෂ්පන්නකොට කාන්තාව පිළිබඳව සානුකම්පිත කියවීමක් සරච්චන්ද්‍රයන් සිදු කරයි. පබාවතී චරිතය තද සිත් ඇත්තියක ලෙස පෙන්වනවාට වඩා ඇය තුළ ස්වකීයව ඇතිවන චිත්ත විපර්යාස නිසා සිදුවන ක්‍රියාදාමයක් නාට්‍යය තුළ පෙන්වා දෙයි. ''මනමේ'' නාට්‍යය තුළ ද ජාතක කතා කරුවාගේ පාරම්පරික දෘෂ්ඨිය වූ **"**මාතුගාමයෝ නම් පව්ටු සත්ව කෙනෙක්**"** යන්න බිඳ හෙළයි. මනමේ නාට්‍ය තුළ, මනමේ කුමරියගේ සිත තුළ ඇතිවන අනිසි බිය නිසා ජීවිතයේ ප්‍රථමවතාවට ස්වයං තීරණයක් ගැනීමට නාට්‍යකරුවා එම චරිතයේ ක්‍රියාකාරීත්වය මෙහෙයවයි. සිතීමේ නිදහස, අරගලය හා ජීව විද්‍යාත්මකව ඇතිවන සිතිවිලි ප්‍රවාහය තුළ එම කාන්තා

චරිතයේ කාරකගුණය ඉස්මතු කරවයි. මනමේ කුමරා මරුමුවට පත්වන්නේ කුමරිය තුළ ඇතිවන එම අරගලය වැදිරජු විසින් අවස්ථාවක් බවට පත්කරගන්නා නිසා ය.

**ජාතක කතා දෘෂ්ටිය** - සොරාට කඩු මිට දී චුල්ල ධනුද්දරයන්ට කොපුව දී ලුහ

**මනමේ නාට්‍යයේ දෘෂ්ටිය -**

දිරියෙන් යුද කල ඔබ සමගින්නේ
සෙනගින් පිහිට ද නොම සොයමින්නේ
තනියෙන් සටනට සැරසී එමින්නේ
මෙකගින් ඇයි ඔහු ගෙල සිඳලන්නේ
සිදු වූ දෙයින් ඈ තිගැස්සුනාය, අන්දුන්කුන්දුන් වූවාය

මනමේ නාට්‍යයේ මූලික කතා ඉතිහාසයට අනුව මනමේ කුමරිය සිය පියාගේ රමුව තුළ වැඩුණු කුල ස්ත්‍රියකි. ඇයගේ ජීවිතයේ සියලු ම තීරණ ගන්නට ඇත්තේ පියා විසින් ම ය. පාඨශාලාවක හැදී වැඩෙන යොවුන් තරුණියකට පාසලේ වෙනයම් යොවුන් ගැටවරයකු වෙත සිත් ඇතිවන්න නුපුළුවන් ද? එසේ වුව ද මනමේ කුමරියගේ විවාහ සහ ලිංගික අයිතිය මුලින් ම උල්ලංගනය වන්නේ සිය පියා අතින් ය. ඔහු විසින් දියණියව විවාහ කර දීමට තීරණය කරන්නේ පාසලේ කීර්තිමත් සිසුවාට ය. මනමේ කුමරිය සහ කුමරා මහ වනයක ගමන් කරන අතරතුර මනමේ කුමරිය ප්‍රේමාන්විත වූව ද මනමේ කුමරා ස්වභාව සෞන්දර්යය වර්ණනය කරයි. වැදිරජු පැමිණි පසු මනමේ කුමරාට වඩා ප්‍රෞඩත්වයක් ඔහුගෙන් පෙනෙන්නට පටන් ගනියි. මනමේ කුමරා සහ වැදිරජු අතර හැලහැප්පීම අතර මනමේ කුමරිය මානසිකව අතරමං වෙයි. මේ නාට්‍ය කරුවාගේ දෘෂ්ටියයි. ජීවිතයේ කෙදිනවත් ස්වයං තීරණයක් ගැනීමට හුරුපුරුදු නොවූ මනමේ කුමරිය වික්ෂිප්ත වෙයි. නාට්‍යකරුවා මනමේ කුමරියව ස්වයං තීරණයක් ගැනීම දක්වා මෙහෙයවයි. නාට්‍යය තුළ වැදිරජු ඒ මොහොත ප්‍රයෝජනයට ගනියි.

උම්මග්ග ජාතක කතාව ආශ්‍රයෙන් නිර්මාණය වූ දික්තල කාලගෝල නාට්‍යය තුළ ද සාම්ප්‍රදායික දෘෂ්ටිය බිඳ දමා දික්තලාගේ හැසිරීම නිර්මාණකරුවා නිරවද්‍ය කරවයි. උම්මග්ග ජාතකයේ දී ජාතකකතාකරුවා දික්තලා දික්පිටියා සමඟ පැනයාම අර්ථවත් කරන්නේ ස්වකීය ස්වාමියා කෙරෙහි නිසි රුචිකත්වයක් නොමැතිව වෙනකෙකු සමඟ පැනයන දෘෂ්ටියකිනි. නමුත් නාට්‍යකරුවා එය පිහිටුවන්නේ කාන්තාවකගේ නිදහස් ලිංගිකත්වය හා ආදරය යන ආස්තානයක යි. එය ඉතාමත් මානුෂීය කාරණාවක් ලෙස නාට්‍යකරුවා කියවීමට ළක් කරයි. කාන්තාවක් ලෙස නොව මනුෂ්‍යකු ලෙස ඇයට ඇති අයිතිය නාට්‍ය තුළ සාධාරණීකරණය කරයි. ජාතක කතාව තුළින් ගෙන එන්නා වූ සරල දෘෂ්ටිකෝණය නොව මානුෂීය පැවැත්මෙහි දික්තලා විසින් ලබාගන්නා වූ නිදහස් ස්ත්‍රීවාදී අරගලයක අයිතිය නාට්‍යකරුවා විසින් පෙන්වා දෙයි.

**දික්තල කාලගෝල නාට්‍ය දෘෂ්ඨීය**

> නීතියට අනුව මෙම ස්ත්‍රිය කාලගෝලට අයිතිය. එසේ හෙයින් දික්තල කාලගෝලයට අයිති බවට මම නියෝග කරමි. එහෙත් තොපගේ දෙවැනි ඉල්ලීම ඉටු කිරීමට හැකි විනිශ්චයකරුවකු මෙතෙක් ලොව පහළ වී නැත. ස්ත්‍රියකගේ ආලය නීති මාර්ගයෙන් ලබාගත නොහැක්කකි.

නූතන නාට්‍ය ආකෘතියක් තුළ නිෂ්පාදනය වූ තුසිත ලක්නාත් විසින් නිර්මාණය කළ චත්‍රපානි වේදිකා නාට්‍යයේ පුරුෂාධිපත්‍යය තුළ අරගල කරමින් සිටින බිසවත්, කුඩුම්භය බිඳ දමා ආදරය, ජීවිතය හා පැවැත්ම වෙනුවෙන් පැනයන චත්‍රපානි රජුගේ දුවගේ භූමිකාව ද  මෙම සාකච්ඡාවට නිදසුන් ලෙස දැක්විය හැකිය.

නිදහස් ප්‍රේමය, නිදහස් ලිංගිකත්වය, නිදහස් චින්තනය, නිදහස් පරිභෝජනය, අධ්‍යාපනික නිදහස වැනි නිදහස් ස්ත්‍රී සංකල්ප තුළින් කාන්තා චරිතයන්ගේ ක්‍රියාකාරීත්වයන් සංකීර්ණ මෙන් ම හේතුඵල ගුණ සහිතව පෙන්නුම් කිරීමට නූතන නිර්මාණකරුවා උත්සහගෙන තිබේ. සමාජ ජීවියෙක් ලෙස කාන්තාවන් සඳහා තිබිය යුතු නිදහස් අවකාශය ඔවුන් නිර්මාණ තුළින් සාකච්ඡා කර තිබේ. කාන්තාවකට සමාජය තුළ නිදහසේ ස්වකීය මතවාදයකින් නැගී සිටීමට මෙන් ම ස්වකීය අදහස් සඳහා පුරුෂමූලික සමාජය තුළ ඉඩක් ලැබිය යුතු බවත් ඒ හරහා කාන්තාව වඩාත් ප්‍රයෝග්‍ය මෙන් ම අවස්ථානුකුල තත්වයකට පත්වන බව නිර්මාණකරුවන් නිර්මාණ තුළින් පෙන්වා දෙයි. මෙම තත්වය ජාතක කතා සාහිත්‍ය තුළින් ජාතක කතාකරුවා නිශ්පන්න කිරීම තුළ ඒ ඒ සමාජයන් තුළින් කාන්තාව වඩාත් අඥාණ නිශ්ප්‍රයෝග සත්වයෙක් බවට පත්ව තිබුණ ද ඒ සඳහා  නිර්මාණාත්මක ප්‍රතිරෝධයක් ගොඩනගන්නට නාට්‍යකරුවාට හැකියාව තිබී ඇත. ඒ නිසා සමාජය තුළ මතවාදාත්මකව වෙනසක් ඇති කිරීමට හැකි බව ඔවුන් තරයේ විශ්වාස කරන්නට ඇත. මෙම අරගලය සෙසු සාහිත්‍යාංගයන් තුළ ද පසුකාලීනව දැකීමට හැකි ය. සහිත්‍යය සමඟ සමකාලීන පුද්ගලයාගේ ආසක්ත බව ඉහල මට්ටමක පැවති අතර නිදහස් කාන්තා අරගලය එම පදනම මත ම ආරම්භ කිරීම ඉතාමත් වැදගත් කරුණකි. නාට්‍ය වැනි වඩාත් ප්‍රායෝගික මෙන් ම ක්‍රියාමූලික සාහිත්‍යයක් මඟින් එය සිදු කිරීම තවත් ශක්තිමත් ආරම්භයකි. ජාතකකතා සාහිත්‍යය අත්පොතක් ලෙස භාවිත කරන ලද සමාජයක රංගකලාව විනෝදාස්වාදාත්මක තත්වයකින් මිනිසාට ආසක්ත වනවිට ඒ තුළ මෙම අරගලය සිදු කිරීම නාට්‍යකරුවා සිදු කර ඇත. ස්ත්‍රී කාරකගුණය සාධාරණිය කිරීමටත් ඒ පිළිබඳව දෘෂ්ඨිවාදාත්මකව බැලීමටත් නාට්‍යකරුවා මෙම අරගලය තුළ දී පෙළඹී තිබේ. එහි දී ජාතක තතා සාහිත්‍යය තුළ පවතින කාන්තා චරිතයන්ගේ නියෝජනය වඩාත් නිදහස් (Liberal) අරගලයක කුටප්‍රාත්තියක් දක්වා නාට්‍යකරුවා ගෙනගොස් ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. අමරකීර්ති,ලියනගේ., මනමේ නාටකය සංස්කෘතික ඉතිහාසය හා සංස්කෘතික විචාරය, වටමඬල අතිරේකය, දිවයින පුවත්පත., 2014-01-09
2. ගලහිටියාව,පී.බී., මනමේ විචාර විමසුම,නිර්මල ප්‍රකාශන, 2018, ප්‍රථම මුද්‍රණය

3. සිල්වා, සසන්ත., ජාතක කතා හා නාට්‍ය මූලධර්ම, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ පුද්ගලික සමාගම, 2012, ප්‍රථම මුද්‍රණය
4. සිල්වා,සසන්ත., ජාතක කතා හා සිංහල නාටකය, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ පුද්ගලික සමාගම,2012 ප්‍රථම මුද්‍රණය
5. ප්‍රබාෂිණී, සුබෝධා., මනමේ හී භාවිතය කුමක්ද, බූන්දි වෙබ් අඩවිය, 2013-08-26
6. රූපසිංහ, සංජීවනී., පෙරදිග ස්ත්‍රීවාදය, කර්තෘ ප්‍රකාශන, 2007, ප්‍රථම මුද්‍රණය
7. වික්‍රමසිංහ, මාර්ටින්., ජාතක කතා විමසුම, සරස පෞද්ගලික සමාගම, 2015, සයවන මුද්‍රණය
8. සරත්චන්ද්‍ර, විජිතනන්ද., ජාතක පොතෙන් නිරූපිත සමාජය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2016, ප්‍රථම මුද්‍රණය
9. සේනානයක, කොලට්., කරුණාතිලක,නාරද. බෞද්ධ නාට්‍ය ශාස්ත්‍රය, බෝධි සභාව, 2006, ප්‍රථම මුද්‍රණය
10. හෙට්ටිආරච්චි, ගිහාන් මධුසංඛ., ජාතකකතා අද්භූතය හා යථාර්ථය, සමයවර්ධන පෞද්ගලික සමාගම, 2018, ප්‍රථමමුද්‍රණය
11. Lelanuja, Orada., Women and Buddhism in Playwriting, Dissertation for Doctor of philosophy, Texas Tech University, 2011